නිපුණතාව 13.0 - අනුපාත මගින් මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 13.6 - ආයෝජකයන්ගේ අනුපාත ගණනය කර අර්ථකථනය කරයි.

2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් හිමිකම් වෙනස්වීමේ උධෘතය සීමාසහිත දෙව්මිණි සමාගමෙන් උපුටා ගන්නා ලදී.

රු.000

| | සා.කොටස් ප්‍රාග්ධනය | පොදු සංචිත | රඳවාගත් ලාභය |
|---|---|---|---|
| 2019/04/01 ශේෂය | 10,000 | 2,000 | 1,000 |
| කාලච්ඡේදයේ ලාභය | | | 4,000 |
| පොදු සංචිතය | | | (500) |
| ගෙවූ ලාභාංශ | | | (1,000) |
| 2020/03/31 ශේෂය | 10,000 | 2,000 | 3,500 |

2020/03/31 දිනට සාමාන්‍ය කොටසක ප්‍රතිෂ්ඨාව රු.20කි.

1.සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට 2020 වර්ෂයේ කොතරම් ලාභ බෙදා දීමට හැකිද?

2.අතුරු ලාභාංශ වශයෙන් කොතරම් ප්‍රමාණයක් වර්ෂය තුළ ගෙවා ඇත්ද?

3.සමාගමේ සාමාන්‍ය කොටස් ගණන කවරේද?

4.කොටසක ඉපයුම ගණනය කරන්න.

5.කොටසක ලාභාංශය ගණනය කරන්න.

2.) ආයෝජන අනුපාත මගින් ව්‍යවසායකයෙකුට ලබා ගත හැකි ප්‍රතිලාභ මොනවාද?